**මහරගම නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**-----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2016 වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 අගෝස්තු 23 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 20 දින ලේකම් වෙත යවා ඇත.

### 1.2. තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

2014 හා 2015 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු එකතු වටිනාකම රු.3,647,197 ක් වූ විගණන ගාස්තු දෙවරක් වෙන්කර තිබුණු අතර ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙන්කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
**-------------------------**

ගිණුම් විෂයයන් 05කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල රු.98,011,154 ක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
**-----------------------------------**

තැන්පත්, අත්තිකාරම් හා ලැබිය යුතු ගිණුම් විෂයයන් 14 ක වටිනාකම වූ රු.107,277,500 ක් සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීමෙන් මෙම ශේෂවල නිවැරදිභාවය තහවුරුකර ගැනීමට නොහැකි විය.

#### 1.3.4 නිරවුල් නොකළ ශේෂ
**-------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අයවිය යුතුව තිබුණු සේවක ණය ශේෂය රු.32,352,659 ක් වූ අතර එම ශේෂය තුළ දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පැවති සේවය හැර ගිය, ස්ථාන මාරු වී ගිය හා මිය ගිය සේවකයන් 56 දෙනෙකුගෙන් අයවිය යුතු රු.550,386ක් වූ ශේෂයක් සමාලෝචිත වර්ෂයේදීද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි

(ආ) අගරු වන චෙක්පත් හඳුනාගෙන එය නැවත අයකර ගැනීමට හෝ නැවත ණයගැතියන් ඇති කිරීමට කටයුතු කිරීමකින් තොරව රු.27,446 ක් අගරු අත්තිකාරම් නමින් ගිණුමකට හරකර තිබුණි.

### 1.3.5 ගිණුම්වල හෙළිදරව් නොකිරීම

ආයතනය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ප්‍රවර්තන වර්ෂය තුළ නඩු 08 ක් පවරා තිබුණු අතර නඩු 03 ක් සඳහා රු.43,380 ක් අයවිය යුතුව තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරික්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) නගර සභා ආඥා පනතේ 255 අධිකාරියේ 165 වන "ඈ" උපවගන්තිය | නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එමවිකුණුම් වටිනාකමින් සියයට 1 කට සමාන බද්දක් විකුණුම්කරු විසින් සභාවට ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සිදු කරනු ලැබූ ඉඩම් විකුණුම් 12 කින් සභාව විසින් අය කර තිබුණේ ආදායම් පරීක්ෂකවරයා විසින් ඇස්තමේන්තුකර තිබූ විකුණුම් වටිනාකමින් සියයට 1 ක් වූ රු.4,489,621ක් පමණි. මෙම ඇස්තමේන්තු වටිනාකම හා ඉඩම් කොටස්වල සත්‍ය විකුණුම් වටිනාකම අතර වෙනස සොයා බලා එම වෙනස අයකර ගැනිමට සභාව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ.133 (1) ,(2) සහ මු.රෙ. 134(1),(2) හා (3) | අභ්‍යන්තර විගණන අංශයේ පරමාර්ථ හා කාර්යයන් ඉටුකරගත හැකි පරිදි කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි. |
| මු.රෙ. 188 (2) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පතක හා මුදල් ඇනවුම් 03 ක වටිනාකම වූ රු. 9,325 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 371 | ලබා ගන්නා ලද අත්තිකාරම් අදාළ කාරණය නිමකල වහාම පියවා අවසන් කළයුතු වුවද සභාව විසින් නිලධාරීන්ට නිකුත්කර තිබූ අත්තිකාරම් පියවීම සඳහා දින 27 සිට දින 356 දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. |
| මු.රෙ. 396 (ඈ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ චෙක්පත් 49 ක වටිනාකම වූ රු. 162,909 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.192,729,139 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.88,994,545ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.103,734,594 ක වර්ධනය සඳහා වෙනත් ආදායම් හා ආදායම් ආධාර වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සභාවේ ප්‍රාග්ධන ආදායම් හා වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය රු.71,436,301 ක් වූ අතර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වර්ධනය වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 12.51 ක අවාසිදායක ප්‍රතිශතයක සිට සියයට 41.34 ක වාසිදායක ප්‍රතිශතයක් දක්වාද වියදම සියයට 105.7 ක අවාසිදායක ප්‍රතිශතයක සිට සියයට 35.7 ක වාසිදායක ප්‍රතිශතයක් දක්වා වූ පරාසයක විචලනයන් ද පැවතුණි.

## 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අංක 607629 දරන ජංගම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට රු. 2,052,258 ක හර ශේෂයක් දක්වා තිබුණද බැංකු ශේෂ තහවුරුවට අනුව 2015 අගෝස්තු 25 දින මෙම ගිණුම අවසන් කර තිබීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට ශේෂයක් නොතිබුණි. එසේ වුවද වර්ෂය අවසානයට මුදල් ශේෂය රු. 2,052,258 ක් සාවද්‍ය ලෙස වැඩියෙන් දක්වා තිබුණු අතර ඒ අනුව හඳුනා නොගත් හර ශේෂය රු.2,052,258 ක් හා හඳුනා නොගත් බැර ශේෂය රු.190,470 ක් වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ සාරාංශ ගත තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | 2015 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකර ගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | තථ්‍ය අයකරගත යුතු | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 97,995 | 70,328 | 27,667 | 60,045 | 90,718 | 74,306 |
| බදු කුලී | 18,594 | 15,761 | 2,833 | 6,837 | 18,520 | 17,376 |
| බලපත්‍ර ගාස්තු | 1,023 | 948 | 75 | 307 | 1,002 | 18 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වෙනත්ආදායම් | 350,751 | 347,241 | 3,510 | 178,502 | 258,007 | 162,209 |
| | ---------- | ----------- | ---------- | ------------ | ------------ | ------------ |
| | 468,363 | 434,278 | 34,085 | 245,691 | 368,247 | 253,909 |
| | ====== | ====== | ====== | ======= | ======= | ======= |

**2.3.2 වරිපනම්**

----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 ජනවාරි 01 දිනට පැවති රු. 62,556,325 ක සමුච්චිත හිඟ වරිපනම් බදු මුදලින් සමාලෝචිත වර්ෂයේ අයකරගෙන ඇති වටිනාකම රු.32,656,885 ක් වූ අතර සියයට 48 ක් එනම් රු. 29,899,440ක් අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල වරිපනම් බදු ආදායම රු.81,979,717 ක් වූ අතර වර්ෂය තුළදී රු.54,311,924 ක් පමණක් අයකරගෙන තිබුණද බිල්කල ආදායමින් සියයට 44 ක් එනම් රු.22,667,793 ක් අයකරගෙන නොතිබුණි.

(ඇ) වරිපනම් අංක ඇති නමුත් භෞතිකව එවැනි දේපලක් නොමැති හා නගර සභාවට අයත් නොවන දේපල වශයෙන් හඳුනාගෙන තිබුණු වරිපනම් ඒකකවලට අදාළ රු.1,944,960 ක හිඟ මුදල කපාහැරීම සඳහා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකිරීම නිර්දේශ කර තිබුණද එම අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලැබී නොතිබුණි.

(ඈ) වර්ෂ 5 කට වරක් දේපල තක්සේරුකර වරිපනම් බදු අයකර නොතිබීම හේතුවෙන් වරිපනම් බිල් කිරීමේදී භෞතිකව නොමැති දේපලවලටද බිල්කර තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට රු.60,045,125 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ රු.100,000 ට වැඩි වටිනාකමකින් යුත් වරිපනම් ඒකක 12 කින් අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.2,774,244 ක් විය.

**2.3.3 බදු කුලී**

--------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වෙළඳසැල් 405 ක් හා මස් වෙළඳසැල් 08 ක් වශයෙන් වෙළඳසැල් 413 ක් පැවති අතර 2016 දෙසැම්බර් 31 දිනට වෙළඳසැල් 168 කින් හා මස් වෙළඳසැල් 08 කින් රු.7,399,266 ක මුදලක් අය නොවී පැවතුණි. මේ තුළ වෙළඳසැල් 98 කින් මාස 06 සිට මාස 85 දක්වා හිඟහිටි කඩකුලිය රු. 7,170,073 ක් වුවද කුලී ගිවිසුම් අවලංගුකර කඩ කාමර පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ බිල්කරන ලද කඩකුලී ආදායම රු.13,534,365 ක් වුවද වර්ෂය තුල ලැබී තිබුණු කඩ කුලිය රු.9,621,402 ක් වීමෙන් රු.3,912,963 ක් හෙවත් සියයට 29 ක් වර්ෂය තුළ ලැබී නොතිබුණි.

(ඇ) අයකරගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු නොකර හිඟ කඩකුලිය රු.12,143,405 ක් කපා හැර තිබුණි.

(ඈ) මහරගම සති පොළෙහි වසා දමා ඇති කඩ කාමර 37 ක් පවරා ගැනීමට ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා නොකර කඩ කාමර 09 ක් සඳහා දීර්ඝ කාලයක සිට බිල්කිරීම් කර නොතිබුණි.

(ඉ) බදු ගිවිසුම අත්සන් කළ දින සිට වර්ෂ 05 ක් කල් ඉකුත් වූ පසු නැවත බදු ගිවිසුම අලුත් කිරීමේ අයිතිය නගර සභාව සතු වුවත් වර්ෂ 10 ක් ඉක්ම ගියද කඩකුලී තක්සේරුව ප්‍රතිශෝධනය කර බදු ගිවිසුම අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) බදු දේපල අතුරු බදු දීම, කුලියට දීම, හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගැනීම ආදී අන්සතු කිරීමක් කර ඇද්ද යන්න හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නගර සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ට්‍රැක්ටර් 02 ක් සහ ට්‍රේලරයක් 2002 වර්ෂයේදී හෝමාගම ප්‍රාදේශීය සභාවෙන් මහරගම නගර සභාවට ලබාදී තිබුණද එම වාහනවල වටිනාකම තක්සේරු කර පවරාගෙන නොතිබුණු අතර එක් ට්‍රැක්ටරයක් දැනට ගර්හිත තත්වයේ පැවතියද සභාවේ අයිතියට පවරා නොගැනීම නිසා ඉවත් කිරීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණි.

(ආ) අනතුරට පත්වී තිබුණු ට්‍රේලරයක් ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටද අලුත්වැඩියාකර නොතිබුණු අතර රක්ෂණ වන්දි වශයෙන් ලබාදීමට එකඟවූ රු.20,000 ක් 2017 ජූනි 22 දින දක්වාද ලබාගෙන නොතිබුණි.

**3.2 හඳුනාගත් අලාභ**

------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාලසීමාව තුළ සාමාජිකයින් 137 ක් විසින් රු.59,854ක් වටිනා පුස්තකාල පොත් 231 ක් පුස්තකාලයට භාරදී නොතිබුණි.

(ආ) 1988 වර්ෂයේ සිට 2010 දක්වා මියගිය නිලධාරීන් 14 දෙනෙකුගේ ණය ශේෂවල එකතුව රු.214,012 ක් අයකරගෙන නොතිබුණි.

**3.3 ආර්ථික නොවූ ගනුදෙනු**

--------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහරගම සතිපොල පරිශ්‍රය පවිත්‍ර කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික සමාගම් දෙකක් සමඟ ඇතිකරගෙන තිබූ ගිවිසුමට අනුව 2016 වර්ෂය සඳහා පවිත්‍ර කිරීමේ ගාස්තු වශයෙන් රු.4,258,358 ක් ගෙවා තිබුණ ද එම කාලසීමාව සඳහා පොල බදු ආදායම් ලෙස ලැබී තිබුණේ රු.2,763,495 ක් පමණි.

(ආ) වර්ෂය පුරා මිල ගණන් නොවෙනස්ව බලපැවැත්වෙන පරිදි සැපයුම්කරුවන් වර්ෂය ආරම්භයේ ලියාපදිංචිකර ගැනීමට කටයුතු නොකිරීම නිසා වර්ෂය මුල තිබූ මිල ගණන්වලට සාපේක්ෂව 2016 ජූලි මාසයේදී බල්බ 3000 ක් මිලදී ගැනීමේදී රු.435,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ඇගයීම් කමිටුව නිර්දේශ කළ අවම මිලට වඩා වැඩි මිලකට එම ආයතනයෙන්ම විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා රු.12,350 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) <u>ව්‍යාපෘති කාර්යසාධනය</u>

i. සමාලෝචිත වර්ෂයේ සභා බලප්‍රදේශය තුළ රු.295,710,779 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 392 ක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන්කර තිබුණු අතර නිමකළ ව්‍යාපෘති 358 ක් සහ නොනිමි ව්‍යාපෘති 16 ක් වෙනුවෙන් රු.235,433,099 ක් වැයකර තිබුණද ව්‍යාපෘති 18 ක් අවලංගුකර තිබුණි.

ii. මංමාවත් හා කාණු ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා වෙන්කරන ලද මුළු ඇස්තමේන්තුවෙන් වැය නොවී ඉතිරි වූ මුදලේ ප්‍රතිශතය 0.02 සිට සියයට 100 දක්වා පරාසයක විය.

iii. මාර්ග නඩත්තු සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලින් සියයට 18 ක් ඉටුකර නොතිබුණි.

(ආ) <u>කොන්ත්‍රාත් පිරිනැමීම</u>

සභාව විසින් ප්‍රවර්තන වර්ෂය තුළ පිරිනමන ලද කොන්ත්‍රාත්වලින්සියයට 98 ක් පමණ සාමාජීය සංවිධාන වෙත ප්‍රදානය කර තිබුණු අතර ඒ තුළ රුපියල් ලක්ෂ 10 ත් 20 ත් අතර වටිනාකමින් යුතු ගොඩනැගිලි ඉදිකිරීම්, මාර්ග කාපට් කිරීම් හා මාර්ග සංවර්ධනය කිරීම් වැනි කොන්ත්‍රාත් 100 ක් විය.එසේ වුවද එම සංවිධාන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය ප්‍රකාරව අවශ්‍යතා සපුරා තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) <u>පැපිලියාන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පැපිලියාන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා 2012 වර්ෂයේ රු.7,000,000 ක මුදලක් පළාත් සභා අරමුදලින් ලබාදී තිබුණු අතර 2016 වර්ෂය අවසාන වනවිට රු.5,414,900 ක ඇස්තමේන්තුගත මුදලකට ඊට අදාළ තවත් කොන්ත්‍රාත් 4ක් සභා අරමුදලින් ලබාදී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු මුදල රු.12,414,900 ක් වී තිබුණු අතර ඉන් රු.9,685,238 ක් ප්‍රවර්තන වර්ෂය අවසානය වන විට වැයකර තිබුණද එම ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

(ii) රු.7,000,000 ක මුල් ඇස්තමේන්තුව හා සැලසුම් පිළියෙළ කිරීම සඳහා උපදේශන සමාගමට රු.227,430 ක් ගෙවා තිබුණු අතර එහිදී අදාළ කාර්යය නිමවන තෙක් එම සමාගම විසින් අධීක්ෂණය හා උපදේශන කටයුතු සිදුකළ යුතු බවට එකඟ වී තිබුණද එකී සමාගම විසින් අධීක්ෂණ කටයුතු ඉටු නොකිරීම නිසා කඩුවෙල නගර සභාවේ ඉංජිනේරුවරයා අධීක්ෂණ කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

(iii) ගොඩනැගිල්ල ඉදිකළයුතු බිම පරික්ෂාකර ඉදිකිරීම නිසි පරිදි සිදුකිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු පිළියෙළ කරනු වෙනුවට, රු.7,000,000 අරමුණු කරගෙන ඇස්තමේන්තුව පිළියෙල කිරීම හේතුවෙන් ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ අමතර සහ අතිරේක කාර්යයන් සඳහා රු.4,132,937 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

(iv) මුල් ඇස්තමේන්තුව අනුව පැරණි වහලය ඉවත් කිරීමේ පිරිවැය රු.50,000 ක් වුවද බිල් පත්‍රය අනුව රු.55,000 ක් ගෙවා තිබීම හේතුවෙන් රු.5,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ මුළු ඇස්තමේන්තුව එකවර ඉදිරිපත් කරනු වෙනුවට රු.12,414,900 ක් වූ ඇස්තමේන්තුව වරින්වර කොටස් 05 ක් ලෙස කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට පිරිනමා තිබුණි.

(vi) වහලය සවිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.1,499,900 ක් වූ අතර සමර්ප කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල රු.1,488,360 ක් වුවද කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණේ ඉදිරිපත්කරන ලද මිල ගණනට වඩා රු.11,540 ක් වැඩි වටිනාකමක් තිබුණු ඇස්තමේන්තුගත මුදලට විය. තවද ඉදිරිපත්කරන ලද ලියවිලිවල අත්සන් මකන දියර යොදා වෙනස්කර තිබුණි.

(vii) මුල් ඇස්තමේන්තුව අනුව රු.672,485 ක් වූ වහලය ඉවත් කිරීමේ හා නැවත සවිකිරීමේ වියදම නව ඇස්තමේන්තුව අනුව රු.1,488,360 ක් එනම් සියයට 44.84 කින් වැඩිවී තිබුණු අතර එය වැඩ විෂයයන් වශයෙන් වෙන්කර දක්වනු වෙනුවට සමස්ත වටිනාකම පමණක් දක්වා තිබුණි. තවද අලුතින් ඉදිකරන ලද වහලය 2016 මුල් අර්ධ වර්ෂයේදී කාලගුණික හා දේශගුණික හේතූන් මත ගැලවී ගොස් තිබුණි.

(viii) ඇලුමිනියම් දොර ජනේල සවිකිරීම සඳහා වූ රු.1,300,000 ක කොන්ත්‍රාත්තුව 2016 පෙබරවාරි 03 දින කර්මාන්ත පිරිනැම්මේ කමිටුව තීරණය කරන ලද සංවිධානයට නොව වෙනත් සංවිධානයකට පවරා තිබුණි.

(ඇ) <u>සති පොළ පොල් අලෙවිය සඳහා කඩකාමර ඉදිකිරීම- රු.7,300,349</u>

කඩකාමර ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත කාර්යයන් අතරින් වටිනාකම රු.2,153,676 වූ කාර්යයන් 27 ක් ඉටුකර නොතිබුණු අතර මෙම කඩ කාමර ඉදිකිරීමෙන් පසුවද අඩුපාඩු පැවතුණි. තව ද විස්තරාත්මක සැලැසුම් නොතිබුණි.

(ඉ) <u>නාවින්න ජයගත් පාර ප්‍රජාශාලාව ඉදිකිරීම</u>

අඩියර 06 ක් යටතේ රු.6,427,965 ක් වැයකර නාවින්න ජයගත් පාර ප්‍රජා මණ්ඩල කොටස පෙර පාසලක් බවට පරිවර්තනය කර 2015 මාර්තු මස ජනතා අයිතියට පවරා දී තිබූ නමුත් මෙම ගොඩනැගිල්ල කිසිදු ඵලදායි කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබුණි. තවද මෙම ගොඩනැගිල්ලේ ඉහළ මහල ඉදිකිරීම් සිදු නොකිරීම නිසා කොන්ක්‍රීට් ස්ලැබ් එක අව්වට හා වැස්සට නිරාවරණය වීමෙන් ඒ තුළින් ජලය බිත්ති තුළට කාන්දුවීම නිසා දියසෙවළ බැඳී තිබුණු අතර ඇතැම් බිත්ති කොටස්වල පිපිරීම්ද තිබුණි.

(ඊ) <u>මහරගම සතිපොළ පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවා සැපයීම</u>

පෞද්ගලික සමාගම් දෙකකට පවරා තිබූ මහරගම සතිපොළ භූමියේ පවිත්‍රතා කටයුතු ඉටුකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) එක් සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුම 2016 මාර්තු 31 දිනෙන් අවසන් වී තිබුණද එම සමාගම 2016 සැප්තැම්බර් 15 වන දින දක්වා සේවා සැපයීම වෙනුවෙන් රු.2,894,436 ක් ගෙවා තිබූ නමුත් කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් නව ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ii) ගිවිසුම අනුව මසකට වාර 13 ක් කසළ ප්‍රවාහනය කළ යුතු අතර අමතර සේවා සැපයීම වෙනුවෙන් වරකට රු.6,000 ක් බැගින් ගෙවීම් කළ යුතු වුවද මසක් තුළ ප්‍රවාහනය කළ යුතු වාර 13 ට අතිරේකව 2016 ජනවාරි සිට මැයි දක්වා කාලය සඳහා වාර 83 ක් වෙනුවෙන් රු.507,922 ක් 2016 දෙසැම්බර් මසදී ගෙවා තිබීමෙන් මසකට වාර 16 ක් වැනි ප්‍රමාණයක අතිරේක කසළ බැහැර කිරීමක් සිදුකර තිබුණි.

(iii) සතිපොළ පවිත්‍ර කිරීම සහ සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් 2016 සැප්තැම්බර් 15 සිට 2017 සැප්තැම්බර් 14 දක්වා වෙනත් සමාගමක් සමඟ ගිවිසුම් අත්සන්කර තිබුණු අතර ගමන් වාර 13 ක් සඳහා මසකට රු.214,000 ක් ගෙවීමට එකඟ වී තිබුණි. මෙම සේවාව සැපයීම වෙනුවෙන් ඉහත (i) හි දැක්වෙන පළමු සමාගම ට්‍රිපර් රථයක් යොදාගෙන තිබූ අතර දෙවන සමාගම ට්‍රැක්ටර් රථයක් යොදා කසළ ප්‍රවාහනය කර තිබුණි. ගිවිසුම් අත්සන් කිරීමේදී මෙම සමාගම් දෙක යොදාගත් වාහනවල ප්‍රවාහනය කළ හැකි කසළ ප්‍රමාණය ගැන සැළකිලිමත් වී නොතිබුණි.

## 3.5 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුස්තකාලයක් පිහිටුවීම අරමුණු ලෙස සඳහන් කරමින් සභාව විසින් 2006 වර්ෂයේදි රු.1,200,000 ක් වැයකර ගොඩනැගිල්ලක් මිලදීගෙන තිබුණද මෙම ගොඩනැගිල්ල තුළ 2017 වර්ෂය දක්වා පුස්තකාලයක් ස්ථාපිත කර නොතිබූ අතර වර්ෂ 11 ක කාලයක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි.

(ආ) මහරගම නගර සභාව සතුව මංමාවත් පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) වාහන ලේඛනයේ ඇතුළත් වාහන 03 ක් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඇතුළත්කර නොතිබීමෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිවැරදි නොවීය.

(ඈ) වසර කිහිපයක් තිස්සේ භාවිතයට නොගන්නා තොග, ගබඩාවෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ජයිකා ආධාර යටතේ ලැබූ භාණ්ඩ වර්ග 198 ක් ද ඒ තුළ විය.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගරාජය, සෞඛ්‍ය අංශය, මාර්ග අංශය හා පොදු වෙළඳ සැල මහරගම සහ කොට්ටාව ආදී අංශයන්හි ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 3.6 කසළ කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසළ බැහැර කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය සහ මහරගම නගර සභාව අතර 2016 අගෝස්තු 01 සිට 2018 ජුලි 31 දින දක්වා කාලය සඳහා ඇතිකරගත් නව ගිවිසුම අනුව වැඩිකර තිබූ සේවා ගාස්තු 2016 මාර්තු සිට ජූනි දක්වා වූ කාලය සඳහා අදාළ කරගැනීම හේතුවෙන් රු.5,611,818 ක් වැඩිපුර ගෙවා තිබුණි**.**

(ආ) කසළ කළමණාකරණය සඳහා විධිමත් සැලැස්මක් සභාව සතුව නොතිබීම හේතුවෙන් 2016 වර්ෂය තුළ නගර සභාවට අයත් ප්‍රදේශවල වෙන්කරන ලද කසළ ප්‍රමාණය මෙ.ටො. 1767 ක් හා වෙන්නොකරන ලද කසළ ප්‍රමාණය මෙ.ටො. 29912 ක් වූ අතර මුළු කසළ ප්‍රමාණයෙන් සියයට 94 ක් මිශ්‍ර අපද්‍රව්‍ය ලෙස බැහැර කර තිබුණි. කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.22,434,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

# 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 4.63 සිට සියයට 77.65 දක්වා විචලනයන් පැවතුණු අවස්ථා 17ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන ලැබීම් රු.107,002,000ක් වුවද සත්‍ය ලැබීම් රු.39,788,420 ක් හෙවත් සියයට 37.2ක් විය.

(ඇ) ඇස්තමේන්තුගත වටිනාකම රු.53,434,500 ක් වූ විෂයයන් 114 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) ඇස්තමේන්තුගත වටිනාකම රු.38,888,000 ක් වූ ආදායම් විෂයයන් 11 ක් යටතේ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් එකතු කර නොතිබුණි.

**4.2 ක්‍රියාකාරි සැලැස්ම**

2016 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

**4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

වාර්ෂික කාර්යසාධන වාර්තා නිසි පරිදි සකස්කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ස්ථාවර වත්කම් හා තොග පාලනය
(ඉ) ණයගැති/ ණයහිමි පාලනය
(ඊ) අභ්‍යන්තර විගණනය